# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/73 - 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී. 11/2023

**2023 අංක 26 දරන ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ පනත**

3 වන වගන්තිය යටතේ සාදනු ලබන මාර්ගෝපදේශ

2023 අංක 26 දරන ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන මාර්ගෝපදේශ.

ජනාධිපති නීතිඥ ආචාර්ය **විජයදාස රාජපක්ෂ,**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

**මාර්ගෝපදේශ**

1. මේ මාර්ගෝපදේශ ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීම සඳහා වන මාර්ගෝපදේශ යනුවෙන් හඳුන්වනු ලැබේ:-

2. යම් තැනැත්තකු-

(අ) ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වන්නේ නම්;

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් බඳවාගැනීමේ සිට වසර විස්සකට නොඅඩු කාලසීමාවක් උපදේශන නීතිඥවරයකු වශයෙන් සක්‍රියව නීතිඥ වෘත්තියෙහි නිරතව සිටින්නේ නම්;

(ඇ) නීතිඥ වෘත්තියෙහි විශිෂ්ටත්වයට පත් ව ඇති සහ පැවැත්මෙහි හා වෘත්තීය කටයුතු පිළිබඳ අවංකභාවයෙහි උත්කෘෂ්ට තත්ත්වයක් පවත්වාගෙන ඇත්නම්;


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඈ) යම් ලිඛිත නීතියක් යටතේ යම් අපරාධමය වරදකට වරදකරු වී නොමැති නම්;

(ඉ) 1988 ශ්‍රේෂ්ඨාධිකරණයේ (නීතිඥවරයන් සඳහා වූ වෘත්තීය පැවැත්ම සහ ආචාරධර්ම පිළිබඳ) රීති සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත යටතේ යම් වෘත්තීය විෂමාචාරයකට වරදකරු වී නොමැති නම්;

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය හෝ ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් කිසිදු අවස්ථාවක දී එම තැනැත්තා යම් විනය නියෝගයකට යටත් කර නොමැති නම් සහ යම් අධිකරණයක් විසින් වෘත්තීය විෂමාචාරයකට වරදකරු කර නොමැති නම් සහ ශ්‍රී ලංකාවේ හෝ විදේශීය අධිකරණයක දී අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරු වී නොමැති නම්;

එසේ වුවද, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ නිශ්චිතව දක්වා ඇති යම් වරදක් මේ ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් වරදකට ඇතුළත් නොවේ; සහ

(උ) මනා චරිතයකින් සහ කීර්තියකින් යුත් තැනැත්තකුව සිටින්නේ නම්,

2023 අංක 26 දරන ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ පනත ප්‍රකාරව එකී තැනැත්තා වෙත ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් සලකා බලනු ලැබිය හැකි ය.

3. ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කරන ලද නීතිඥවරුන්ගේ නම් *ගැසට් පත්‍රයේ* සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

4. 2023 දෙසැම්බර් මස 20 වන දින සහ 2363/42 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීම සඳහා වන මාර්ගෝපදේශ මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

EOG 12 - 0349

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.